# කුඩාගම තෙළිඟු ගම්මානයෙහි තෙළිඟු ජනතාව පිළිබඳ ජනශ්‍රැතික අධ්‍යයනයක්

**R.M.W.G. Pradeepa Rajanayaka**

**South Eastern University of Sri Lanka**

**Asst. Lecturer at Department of Languages**

**Pradeeparajanayaka90@gmail.com**

## පර්යේෂණ සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ වෙසෙන දස දහසක් පමණ වූ තෙළිඟු ජාතිකයෝ තවමත් සිය සාම්ප්‍රාධායික ජීවන වෘත්තීන් පවත්වාගෙන යමින් ජීවත් වීමට වෙර දරති. නයි හා රිළවුන් නටවමින් සාස්තර කියමින් සිය ජීවන වෘත්තීයේ යෙදී සිටී. ලංකාවේ ප්‍රදේශ කිහිපයක තෙළිඟු ජනතාව ජීවත් වන අතර වැඩි පිරිසක් ජීවත් වනුයේ තඹුත්තේගම කුඩාගම තෙළිඟු ගම්මානයේ ය. මීට අමතරව අක්කරෙයිපත්තුව, අලිගම්බේ, වව්නියාව, ගල්ගමුව, අන්දරබැද්ද, විජිතපුර, කොමාරිකා යාය, කලා වැව ධීවර ගම්මානය හා තඹුත්තේගම යන ගම්මාන තුළ ද තෙළිඟු ජනයා ජීවත් වේ. මෙහි දී අපගේ පර්යේෂණ කාර්යය සිදුකෙරෙනුයේ කුඩාගම තෙළිඟු ගම්මානය මූලික කරගෙනයි. මෙම ගම්මානයේ පවුල් 480 ක් පමණ ජීවත් වන අතර තෙළිඟු ජනතාව 2000 කට ආසන්නව ජීවත්ව සිටී. ඒ අතර ගොවිතැන් කරන පවුල් 11 ක් ද පොත් පත් විකුණන පවුල් 50 ක් ද වෙනත් රැකියා කරන පවුල් 15 ක් ද පමණ සිටී. තවත් පිරිසක් පිට පළාත් වලට ගොස් ඔවුන්ගේ සාම්ප්‍රාධායික රැකියා වල නිරත වීමක් දක්නට ලැබේ. පර්යේෂණය සිදුකිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර අධ්‍යයන යොදාගත් අතර ද්විතීයික මූලාශ්‍ර ලෙස පෙර කරන ලද පර්යේෂණ සහ පොත්පත් යොදාගනුලැබිණ.  ඒ අනුව ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් ලබා ගත් තොරතුරු පදනම් කොට ගෙන පර්යේෂණය සිදු කොට ඇත. විශේෂයෙන්ම මෙම පර්යේෂණය ප්‍රායෝගික ක්ෂේත්‍ර අධ්‍යයනයක් ලෙස ගැනීම නිවැරදි වේ. මීට අමතරව තෘතියික මූලාශ්‍ර ලෙස අන්තර්ජාල මූලාශ්‍ර ද මෙම පර්යේෂණය සඳහා දායක කොට ගෙන ඇත. ලබාගත් තොරතුරු අනුව පැහැදිලි වූයේ වර්තමානය වන විට තෙළිඟු ජාතිකයන් පිළිබඳ ජනශ්‍රැති කෙමෙන් වියැකී යන බව යි. ඊට හේතු වී ඇත්තේ ආර්ථික වටිනාකම් විනා සංස්කෘතික වටිනාකම් පිළිබඳ ජනතාවගේ ඇති නොදැනුම්වත් භාවයත් තෙළිඟු භාෂාව හා සංස්කෘතිය ආශ්‍රිතව ජතශ්‍රැතියක් රැකීමට මෙතෙක් කටයුතු නොකරීමත් බව පෙනේ. සමස්තයක් ලෙස තෙළිඟු ජාතිකයන් හා සබැඳි ජන දිවිය දුෂ්කර වුව ද ඒ වටා අනන්‍ය වූ සමාජ, සංස්කෘතික පරිසරයක්ද පවත්නා බව පැහැදිලි ය. කුඩාගමවාසී තෙළිඟු ජාතිකයින් තුළ සමාජ, සංස්කෘතික, ආර්ථික, දේශපාලන, අධ්‍යාපන හා ආගමික කටයුතුවල දී තෙළිඟු භාෂාව සමඟ මිශ්‍රව සිංහල හා දෙමළ භාෂා ද යොදා ගන්නා අතර රැකියාවේ දී නම් අවශ්‍ය ලෙස භාෂාව මාරු කර ගැනීමට ඔවුන් සමත්කමක් දක්වයි. එමෙන්ම මේ වන විට තෙළිඟු භාෂකයින්ගේ සංස්කෘතිය තුළ ඉස්මතු වී පෙනෙන විශේෂත්වයන් දක්නට ඇති බවත් මේ වන විට තෙළිඟු වහර ක්‍රියෝලහරණ අවධානමකට ලක්ව ඇති බවත් මෙම පර්යේෂණය මඟින් අනාවරණය විය. එසේ හෙයින් කුඩාගම ආශ්‍රිතව තෙළිඟු ජනසමාජය සහ ඒ වටා බැඳුණු ජනශ්‍රැතිය සොයා යාම මේ පර්යේෂණයේ අරමුණ යි.

**ප්‍රමුඛ පදඃ** තෙළිඟු, මූලාශ්‍ර, භාෂාව, සංස්කෘතිය, භාෂාව, ජනසමාජය

## හැඳින්වීම

රටක විවිධ ප්‍රදේශයන් තුළ එකිනෙකට වෙනස් වූ තමන්ටම අනන්‍ය වූ සිරිත් විරිත් සමාජ අගයන් හා සංස්කෘතිකාංගයන්ගෙන් පොහොසත් බහුවිධ ස්වරූපයේ ජන කොට්ඨාසයන් දක ගත හැකි ය. ඒ එක් එක් ජන කොට්ඨාසයන් තුළ ඔවුන් වහරන බස මෙන්ම සංස්කෘතියේ පවා සුවිශේෂී ස්වරූපයක් ගනී. ජනශ්‍රැති අධ්‍යයන්වලම අංශයක් ලෙෂ ඒ ඒ ජන කාට්ඨාසයන්ට අදාලව ඔවුන්ගේ භාෂාව හා සංස්කෘතිය තුළ සුවිශේෂී පැතිකඩක් විදහා පායි. මෙම අධ්‍යයනය තුළ ශ්‍රී ලංකාවේ වාසය කරන තෙළිඟු ජනතාව පිළිබඳ මෙහි දී අවදානය යොමු කර ඇත. මෙම ජනතාව ජීවත්වන ලංකාවේ 300 ක් පමණ ජනතාවක් ජීවත් වෙති. ඔවුන් සංවිධාන ගත වී රැහේ නායකයෙක් පත් කරගෙන ඔවුන්ට ආවේණික වූ සංස්කෘතිය ආරක්ෂා කිරීමට පියවර ගනිමින් සිටිති. තෙළිඟු ජාතික පිරිස අතීතයේ උතුරු ඉංදියාවෙන් පැමිණි පිරිසකගෙන් පැවත එන්නකි. දීර්ඝ කාලීන ඉතිහාසයකට හිමිකම් කියන ප්‍රාථමික ජන කොටසක් වන තෙළිඟු ප්‍රජාව භාරතීය සම්භවයක් සහිත ජන වර්ගයක් ලෙසින් හඳුනාගෙන ඇත. සංචාරක ජන පිරිසක් වන ඔවුන් දකුණු ඉංදියාවේ සිට මෙරටට පැමිණ ඇති අතර ඔවුන් කවරදාක පැමණියේ දැයි නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි ය. මෙම ජන කොටස් ලංකාවේ උතුරු මැද, වයඹ, නැගෙනහිර හා සබරගමුව යන ප්‍රදේශවල ගැවසෙති.

## පර්යේෂණ ගැටලුව

මූලික පර්යේෂණ ගැටලුව ලෙස හඳුනාගනු ලබන්නේ කුඩාගම තෙළිඟු ගම්මානයෙහි තෙළිඟු ජනතාවගේ නූතන තත්ත්වය තුළ සමාජ, සංස්කෘතික, ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික හා ආගමික කටයුතු පිළිබඳ ජනශ්‍රැතිකාත්මක අධ්‍යයනයක් සිදු කිරීමයි.

## පර්යේෂණයේ වැදගත්කම

මෙම පර්යේෂණයේ වැදගත්කම පිළිබඳ විමසා බැලීමේ දී ප්‍රධාන වශයෙන්ම කිව යුතු කරුණක් වන්නේ උතුරු මැද පළාතේ කුඩාගම ගම්මානයේ ජීවත් වන තෙළිඟු ජනතාව පිළිබඳ සිදු කොට ඇති පර්යේෂණයක් මින් පෙර හමු නොවීම යි. එහෙයින් මෙම තෙළිඟු ජනයාටම ආවේණික භාෂා වහර මෙන්ම සංස්කෘතික තත්ත්වය තුළ පවතින උපභාෂාමය ලක්ෂණ කවරේ ද යන්න සොයා බැලීම පිළිබඳ අධ්‍යයනයට ලක් කරන හෙයින් මෙම පර්යේෂණය එහිලා ඉතාම වැදගත් කොට සැලකිය හැකි ය. කාලයාගේ ඇවෑමෙන් විවිධ වචන වල ඒකරාශී වීම එනම් භාෂා හා සංස්කෘතීන්ගේ සම්මිශ්‍රණය මත වියැකී යන තෙළිඟු ජන භාෂාව හා සංස්කෘතිය අනාගතය වන විට පොත් පත් වලින් ද තුරන් විය හැකි ය. එවැනි පරිසරයක් හමුවේ කුඩාගම වාසීන් අත දැනට ඉතිරිව ඇති පාරම්පරික තෙළිඟු ජන වහර හා සංස්කෘතිය ඒකරාශී කොට තැබීම කාලීනව ඉතා වැදගත් කොට සැළකිය හැකි ය. අනාගත තෙළිඟු ජනයාට ස්වකීය භාෂාවේ අනන්‍යතා ලක්ෂණ හඳුනා ගැනීමට ද එය මහගු පිටුවහලක් වනු නොඅනුමානය.

## පර්යේෂණයේ අරමුණු

කුඩාගම තෙළිඟු ජනතාවගේ නූතන තත්ත්වය මානව විද්‍යාත්මකව අධ්‍යයනයට ලක් කිරීම හා එවැනි ඉතා වැදගත් අධ්‍යයනයෙන් ගිලිහී ගිය පැතිකඩක් සම්බන්ධයෙන් සජීවී පර්යේෂණ වාර්තාවක් සකස් කිරීම.

## ක්‍රමවේදය

මූලිකව ප්‍රථමයෙන්ම උප භාෂා පිළිබඳ අධ්‍යයනය කර ඇති හෙයින් විශේෂයෙන් පොත්පත්වල සඳහන් භාෂාමය තොරතුරු හා මූලාශ්‍රයන් හී අන්තර්ගත තොරතුරු මෙන්ම විවිධ විද්වතුන් විසින් සිදු කළ පර්යේෂණ වාර්තාවල තොරතුරු ද මේ සඳහා භාවිත කර දෙවනුව මෙම අධ්‍යයනය සඳහා ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ කුඩාගම ගම්මානයේ ජීවත් වන තෙළිඟු ජාතිකයින් යොදා ගත් අතර මාතෘකාවට අනුයුක්තව දත්ත විශ්ලේෂණය කිරීමේ දී එය ප්‍රධාන අදියර දෙකක් ඔස්සේ සිදු කොට ඇත. එනම් ප්‍රායෝගික ක්‍රමවේදය හා න්‍යායාත්මක ක්‍රමවේදය යි. ඒ අනුව ප්‍රායෝගික ක්‍රමවේදය යටතේ මූලික අදියර හතරක් ඔස්සේ පර්යේෂණය සිදු කොට ඇත. එනම් දත්ත හඳුනා ගැනීම, දත්ත එකතු කර ගැනීම, දත්ත විශ්ලේෂණය කිරීම හා නිගමනය කිරීම වශයෙනි. දත්ත හඳුනා ගැනීමට නම් මූලාශ්‍ර පරිශීලනය කිරීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු වේ. ඒ අනුව මෙහි දී යොදා ගත් ප්‍රධාන මූලාශ්‍රයන් අතර ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් ලබා ගත් තොරතුරු පදනම් කොට ගෙන පර්යේෂණය සිදු කොට ඇත. විශේෂයෙන්ම මෙම පර්යේෂණය ප්‍රායෝගික ක්ෂේත්‍ර අධ්‍යයනයක් ලෙස ගැනීම නිවැරදි වේ. මීට අමතරව තෘතියික මූලාශ්‍ර ලෙස අන්තර්ජාල මූලාශ්‍ර ද මෙම පර්යේෂණය සඳහා දායක කොට ගෙන ඇත.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පොදුවේ තෙළිඟු ජාතික පිරිස අතීතයේ උතුරු ඉන්දියාවෙන් පැමිණි පිරිසකගෙන් පැවත එන්නන් වේ. ලක්දිව සෑම පළාතකම පාහේ සාමාන්‍යයෙන් ද උතුරුමැද, නැගෙනහිර හා සබරගමුව යන පළාත් වල මොවුන් දක්නට ලැබේ. තෙළිඟු ජනයාගේ මුල් වාසභූමිය ලෙස සළකනු ලබන්නේ ඉන්දියාවය. ඔවුන් එහි සිට ආදියෙහි මෙරටට සංක්‍රමණය වූ අනාර්ය ජන කොට්ඨාසයක් ලෙස සැලකේ. ඔවුන් හැඳින්වීමට යෙදෙන අහිගුණ්ඨික යන ශබ්දයම ඔවුන්ගේ අනාර්ය ප්‍රභවයට සාධකය යැයි විචාරකයන් පවසති. භාවිත කරනු ලබන භාෂාව හා ගති පැවතුම් ආශ්‍රිතව පෙනෙන්නේ ඔවුහු විදේශික සම්භවයකින් පැවත එන්නන් බව ය. ඔවුන්ගේ භාෂාව තෙළිඟු සින්දිය. මානව විද්‍යාඥයන් හා සමාජ විද්‍යාඥයන්ගේ අදහස මොවුන් එකම මූලයකින් පැවත එන ජන කොටසක් බවයි. මානව විද්‍යාඥයන්ට අනුව තෙළිඟු ජාතික සම්භවය සිදුව ඇත්තේ දකුණු ඉන්දියාව තුල වන අතර මදරා හා පාණ්ඩ්‍ය ප්‍රදේශවල ජීවත් වන කොරවර් නම් ගෝත්‍රිකයන්ට මොවුන් නෑකම් කියන බවයි. මානව වංශව විද්‍යාත්මක දත්ත හා මානව රූපාකෘති විද්‍යාත්මක දත්ත අනුව මොවුන් ගේ දකුණු ඉංදියානු සම්භවය පැහැදිළිය. තවදුරටත් මොවුන්ගේ බස දකුණු ඉන්දීය ද්‍රවිඩ පවුලට අයත් භාෂාවක් බව වාග් විද්‍යාඥයන් පැහැදිළි කරයි.

කුඩාගම තෙළිඟු වාසීන්ගේ බස දකුණු ඉන්දීය තෙළිඟු බසට වඩාත් සමීප ලක්ෂණ දරයි. මේ පිරිස ළඟ ඥාතීන් වෙති. ඒ සෑම පවුලක්ම න්‍යෂ්ඨික පවුලක් වන අතර කලාතුරකින් විසිර යන පවුල් දක්නට ලැබේ. මේ සමාජය මෙහෙයවන වෙනම නායකයෙක් සිටින අතර ඔහු ආරච්චිල ලෙස හඳුන්වයි. නයි නැටවීම, රිලවුන් නැටවීම, දඩයම, ශාස්ත්‍ර කීම, මන්ත්‍ර ගුරුකම් වැඩ කරදීම ආදී වෘත්තීන් ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපායන් අතර වේ. ඊට අමතරව සිගාකෑම හා පච්ච කෙටීම ද ඔවුන්ට ආදායම් ගෙන දෙන රැකියාවන්ය. තෙළිඟු ජනයා නමින් හඳුන්වන්නේ මොවුන් ය. වර්තමානය වන විට මහින්තලේ ප්‍රාදේශීය ලේඛම් කොට්ඨාසයට අයත් සියඹලාගස්වැව ගම්මානයේ මායිමේ හා මහකණ්දරාවැව ඉස්මත්ත ආසන්නයේ මේ

වන විට පවුල් 59 ක් ජීවත් වෙති. 1990 වර්ෂයේ දී මොවුන් ජීවත් වූයේ නොච්චියාගම ප්‍රදේශයේ දීය.

තුඩාගම තෙළිඟු ජනතාව වර්තමානයේ බොහෝ දුක් කම්කටොළු රැසකට මුහුණ දීමට සිදුව ඇත. මෙම තෙළිඟු ගම්මානයේ වර්තමානය වන විට දරුවන් 50කට ආසන්න ප්‍රමාණයක් සිටියත් එයින් පාසල් යන්නේ දරුවන් 06 දෙනෙක් පමණක් වෙති. දිනෙන් දින පාසල් ගමන අතහරින දරුවන් වැඩවෙමින් පවතී. 2012 වර්ෂයේ දී මෙම තෙළිඟු ජනතාවට ලැබුණු ඡන්ද අයිතිය මගින් පුරවැසිභාවය ලබා ගැනීමට හැකි වුවත් මිනිස් අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා අරගලයක් කිරීමට සිදු ව ඇත. කුඩාගම ප්‍රදේශයේ 2000ක පමණ ජනතාවක් ජීවත් වන අතර ඔවුන් සංවිධාන ගත ව රැහේ නායකයෙක් පත් කරගෙන ඔවුන්ට ආවේණික වූ සංස්කෘතිය ආරක්ෂා කිරීමට පියවර ගනිමින් සිටියි.

පුරාණ කුඩාගම තෙළිඟු ජාතිකයින් තාවකාලික ලෙස අටවාගන්නා වූ අතු පැල ආශ්‍රිතව ජීවත් වෙමින් ද අතබලා සාස්තර කීම, වඳුරු රැගුම් හෝ නයි නැටවීම වැනි මනුෂ්‍යයන් පිනවීමේ කර්මාන්තයන්හී යෙදී ස්වකීය ජීවිකාව සරිකර ගත් හ. අහි යන්නෙහි තේරුම නාගයා යන්නයි කුණ්ඨික යනු නටවන්නා යන තේරුමයි. ඒ අනුව මොවුන් අතීතයේ නයි නැටවීම ජීවිකාව කරගත් පිරිසක් බව පැහැදිළිය. එහෙත් කුඩාගම වාසීන් මොවුන් අහිගුණ්ඨික යන නමින් හැඳින්වනවාට කැමැති නැත. මොවුන් සංචාරක ජීවිතයක් ගත කළ ජන කොටසකි.

තෙළිඟු පවුල් ක්‍රමය න්‍යෂ්ඨික පවුල් ක්‍රමයක් විය. ඔවුන් පවුල් කිහිපයකින් සැදුණු කණ්ඩායමක් වශයෙන් වාසය කරති. මේ සෑම කණ්ඩායමකම නායකයෙකු බැගින් සිටී. කණ්ඩායමට නායකත්වය සැපයීම අධිකරණ තීරකයා ලෙස කටයුතු කිරීම ආදිය ඔහුට පැවරී ඇත. මෙම නායකයාට මොවුන් ආරච්චි නමින් හඳුන්වයි. මෙම නම සිංහල බසෙන් බිඳී ආ වචනයකි. මොහුව පෙරිය මනුෂ්‍යම යනුවෙන් ද හඳුන්වයි. කණ්ඩායම කිහිපයක ප්‍රධානියා කෝරළේ නමින් හඳුන්වයි. අතීතයේ මොවුන් සඳහා ඇති එක් මතයක් වන්නේ සංචාරක දිවියක් ගතකරන මොවුන් එක් ස්ථානයක දින 07 කට වඩා වාසය නොකරයි යන්න වුවත් කුඩාගම ගම්වාසීන් එසේ නොයයි. කුඩාගම තෙළිඟු වාසීන් දීපවාලී දින රාත්‍රීයේ ආරච්චිගේ ප්‍රධානත්වයෙන් රැස්වෙයි. මේ සඳහා සියළු කණ්ඩායම් පැමිණේ. පැමිණ ඉදිරි කාලයේ සංචාරය කරන ප්‍රදේශ කතිතා කර ගනී. එක් පෙදෙසකට එක් කණ්ඩායමක් පමණක් යෑමට වග බලා ගනී. අතීතයේ සිට ඔවුන් මහා සමාජය සමඟ සහයෝගයෙන් ක්‍රියා කලහ. ඔවුන්ගේ නවාතැන් කුඩාරම විය. ඒවා වාඩි නමින් හඳුන්වයි.

මොවුන්ගේ වෛද්‍ය ක්‍රමය සිංහල ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙන් ලබාගත්තකි. වෙදකම දත් කණ්ඩායමේ වෙදරාළ කෙනෙකුගෙන් ඔවුන් ප්‍රතිකාර ලබා ගනී. විවිධ ශාන්ති කර්ම බහුල වශයෙන් යොදා ගනී. තෙල් මැතිරීම හා නූල් බැඳීම ආදිය ප්‍රමුඛව සුවායි තෛලය නමින් ප්‍රකට ආයුර්වේද ඖෂධයක් ඔවුන් අතර ප්‍රචලිතය. සතුන් සඳහා පුතුකම් නම් ඖෂධයක් ද භාවිත කරයි. මීට අමතරව මොවුන් නිරන්තරයෙන් නාගයින් හා සමීපව කටයුතු කරන බැවින් නයිගල නමින් හඳුන්වන නාග විෂ අද්දවන ඖෂධීය ගලකට සමාන ඖෂධ පෙවූ පාෂාණ කැබැල්ලක් වැනි යමක් ඔවුන් අත දක්නට ඇත. නාග දෂ්ඨනයකදී එය මහෝපකාරී වන බව කියවේ. මීට අමතරව නාග විෂට ඖෂධ ලෙස ගන්නා විවිධ දෑ ඔවුන් අතර විය.

මොවුන්ගේ ආගමික විශ්වාස අතර ලෙස බෞද්ධ ආගම ප්‍රධාන ය. එහෙත් ඔවුන් බෞද්ධ වත් පිළිවෙත් අනගමනය කරනු දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. මොවුන් පන්සල් පල්ලි කෝවිල් ආදී හමුවන ඕනෑම සිද්ධස්ථානයකට යාම සිරිතය. කෙසේ වෙතත් මොවුන් මුස්ලිම් පල්ලිවලට නොයයි. ඊට හේතුව මුස්ලිම් ජාතිකයන් ගවඝාතනය කිරීම හා ගවමස් අනුභව කිරීමයි. තෙළිඟු ජනයා ගව ඝාතනය හා ගවමස් දැඩි ලෙස පිළිකුල් කරයි. ශ්‍රී ලංකාවේ තෙළිඟු ජාතිකයන් අතර ප්‍රචලිත ආගමික ඇදහිලි අතර ඔවුන් දැනට ලක්වාසීන් අතර සම්මතව පවත්නා පිළිගත් ආගම අතරින් අසවල් ආගමට අයත් දැයි එක එල්ලේම නිගමනය කිරීම අපහසුය. ඔවුන් අතර පවත්නා ආගමික ඇදහිලි ඒ තරමට සංකීර්ණ නොපැහැදිලි ස්වරූපයක් ගනියි. බ්‍රාහ්මණ පූජකයන් නොපිළිගන්නා නමුදු ඔවුහු විෂ්ණු කතරගම සහ

පත්තිනි අම්මා අදහති. එමෙන්ම බහුතරයක් ශිව භක්තිකයෝ ද වෙති. ශිව දෙවියා පමණක් නොව කාලි දෙවඟන ද ඇගේ මාරි අම්මා ස්වරූපයෙන් අදහති. ඇතැම් තළිඟු ජාතිකයෝ තමන් බෞද්ධයන් ලෙස ද හඳුන්වා ගනිත තෙළිඟු ජනයා දින 25 කට වරක් කුඩාගම පවත්වන සමිතිවාරය සඳහා අනිවාර්යයෙන්ම පැමිණිය යුතු යි. කුඩාගම තෙළිඟු ජාතිකයන්ගේ ජීවන ආකල්පය පිළිබඳ විමසා බලන විට කිව හැකි වන්නේ ආගම ඔවුන්ගේ ජීවිතය කෙරෙහි එතරම් බල නොපාන්නක් බව ය. පරිසරයට ඔරොත්තු දෙන පරිදි හැඩ ගැසෙමින් මෙලොව ජීවිතය සතුටින් හා සැහැල්ලුවෙන් ද ගත කිරීම පිළිබඳ සිත මෙහෙය වන ඔවුන් අතට පත් කිනම් ආගමක් වුව ද ප්‍රයෝජ්‍යතාවාදයක් බවට පත් වීම නිරායාසයෙන් සිදු වන්නකි.

තෙළිඟු ආහාර ලෙස සිංහල සමාජයේ සම්මත ආහාරම දක්නට ලැබේ. ද්වාර කර්ම හෙවත් උපත වැඩිවිය පැමිණීම විවාහය මරණය යන අවස්ථා වල ද තෙළිඟු ජනයා සිදු කරන චාරිත්‍ර වාරිත්‍ර ගත් විට මොවුන් කිල්ල නම් සංකල්පය විශ්වාස කරන ජන කොටසක් වූ අතර වැදුම් කිල්ල මේ අතරින් වඩාත් බලවත් බව මොවුන් විශ්වාස කරති. ප්‍රසූතියට ආසන්න කාලයේ මව වෙනම කුඩාරමක රදවයි. ඇයගේ සහයට වින්නඹු මාතාවක් හා ගෝත්‍රයේ කාන්තාවක් ද යොදවනු ලබයි. තෙළිඟු ජන සමාජයේ වැඩිවිය පැමිණීමේ චාරිත්‍රය බොහෝ විට මහ සමාජයේ සම්මත චාරිත්‍රවලට අනුවම සිදු විය. එහෙත් හේනේ මාමා ගේ හා රෙදි නැන්දාගේ සේවය ඔවුනට නොලැබුණි. ඒ ඔවුන් මහසමාජයෙන් වෙන්ව වෙනම කණ්ඩායමක් ලෙස සිටි නිසා විය හැක. තෙළිඟු විවාහ බොහෝ දුරට නෑනා මස්සිනා විවාහයන් ය. මීට අමතරව දෙමළ සමාජයේ දක්නට ලැබෙන මාමා ලේලි විවාහ ක්‍රමය ද දක්නට ලැබේ. එනම් තම වැඩිමහල් සහෝදරියගේ දියණිය අවාහ කර ගැනීම දක්නට ලැබේ. මෙම විවාහ ක්‍රමය මගින් ඔවුන්ගේ දකුණු ඉන්දීය ද්‍රවිඩ සම්භවය පැහැදිළි වෙයි. තෙළිඟු විවාහ උත්සවශ්‍රීයෙන් පවත්වනු ලබයි. විවාහයට පෙර මනමාලයා හා මනාලිය වෙනම පැල්පත් දෙකක වාසය කරයි. විවාහ දින ඔවුන් කැඳවා දෙදෙනාගේම සිරුරු වල කහ ආලේප කර කිරිකළ දෙකකින් නහවනු ලබයි. පෝරුව ධාන්‍ය වලින් අතුරයි. කරඹ දං හා පලු අතුවලින් පෝරුව සරසයි. මෙම චාරිත්‍ර බොහෝ විට දකුණු ඉන්දීය ද්‍රවිඩ හිංදු මංගල චාරිත්‍ර වලට සමාන ලක්ෂණ දරයි. විවාහයෙන් පසු මනාලියගේ පාර්ෂවයෙන් යුවතිපති දෙදෙනා වෙත දැවැද්ද ලෙස පේලාවක බහාලන ලද නාගයෙකු රිලවෙකු බල්ලකු බූරුවකු හා ඇඳුම් පැළඳුම් ලබා දෙයි. මේ සඳහා මනාල පාර්ෂවයද දායකත්වය දරයි. තෙළිඟු ජාතිකයන්ගේ අවමංගල උත්සවශ්‍රීයක් නොගනී. මරණයක් වූ විට කිසිවකු හඩා නොවැටේ. වහාම මියගිය පුද්ගලයා සිටි කුඩාරමේ සිලින්ඩාකාර වලක් කපා මළ සිරුර රෙද්දකින් ඔතා ඔළුව යටට සිටින සේ වලට බස්සවා පස්දමා හොඳින් තදකර වසති. එතැන තණ පිඩලි අතුරා මියගිය පුද්ගලයා භාවිත කළ සියල්ල එතැන දමා ගිනි තබයි. තෙළිඟු ජන සමාජය කුලභේදයෙන් තොර වුවක් වුවද පෙළපත් භේදය බලපැවැත් වේ. විවාහ ගනුදෙනු පිළිබඳ කතිකා කිරීමේ දී මනමාලයාගේ පියා හා ආරච්චි ඇතුළු පිරිසට රා සංග්‍රහයක් පැවැත්වීම සිරිතය. තෙළිඟු ජාතිකයන් අතර ඉතා බහුල වශයෙන් සිදුවන්නේ ඇවැස්ස ඥාති සම්බන්ධතාව උඩ සිදු කෙරෙන විවාහ වේ. ඇවැස්ස සහකාරිය නැති විටෙක වෙනත් විවාහයක් කරගත හැකි වුව ද එවිට මනමාලයා අයත් වන්නේ බිරිඳගේ පවුලට ය. තෙළිඟු ජාතික තරුණයෙකුට තරුණියක් අවාහ කර ගැනීමට අවශ්‍ය වූ විට ඔහු තම සිතැගිය කුප්පායමේ සභාව මැද හෙළි කරයි. එයට සියළු දෙනාගේ අනුමැතිය දිනා ගැනීමට අවශ්‍ය වන්නේ හොඳ අරක්කු සංග්‍රහයකි. තෙළිඟු මංගල චාරිත්‍ර ඉතා චාම් ය. මංගල උළෙලේ ප්‍රධාන අංගය වන්නේ රත්රන් පබලුවක් සහිත කලු පබලු පස් පටකින් යුත් මාලයක් මනාලයා විසින් මනාලියගේ ගෙලවටා බැඳීමයි. දායාද වශයෙන් මනාලියට ලැබෙන්නේ නයි පෙට්ටියක් හෝ දෙකක් බූරුවෙක් බල්ලෙක් රෙදිපිළි කිහිපයක් හා ඇට ආභරණ වැනි දේ ය.

සෑම තෙළිඟු ජාතිකයන්ගේ කුප්පායමක් තුළම දැඩි සංවිධානයක් ඇති වා සේ ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින තෙළිඟු ජාතික කුප්පායම් අතරද සංවිධානයක් ඇත. දීපාවලී සමයෙහි දී ශ්‍රී ලංකාවේ වෙසෙන සෑම තෙළිඟු ජාතිකයෙක්ම ඔවුන්ගේ ගෝත්‍ර මූලස්ථානය වන කැකිරාව අසල පිහිටි යම්කිසි ස්ථානයකට වසරක් පාසා එක්රැස් වෙති. තම ගෝත්‍රයට

බලපාන පොදු ප්‍රශ්ණ සියල්ල නිරාකරණය කර ගන්නේ මේ සම්මේලනයේ දී ය. එසේම එහි දී කුල අතර කෙරෙන ආවාහ විවාහ ගිවසුම් පිළිබඳ සමමුතිවලට ද එළඹෙති. මිල මුදල් හා වෙනත් ගනුදෙනු ගැන තීරණ ගැනීම ද එහි දී සිදු කෙරේ.

නොනැසි ජීවත් වන්නේ කෙසේ ද යන්න සෑම මනුෂ්‍යයෙකුටම පොදුවේ මුහුණ පෑමට ඇති ප්‍රධාන ප්‍රශ්ණයයි. බොහෝ අයගේ ප්‍රයත්නය වන්නේ තම සහජ හැකියාවන් හෝ ප්‍රගුණ කරගත් කිසියම් වෘත්තියක් ඔස්සේ සමාජයට බරක් හෝ හානියක් නොවන අන්දමට සිය ජීවතය ගෙන යෑම ය. එහෙත් එම ප්‍රයත්නය අසාර්ථක වූ කල්හී ඔවුන් අනපේක්ෂිත ලෙස විවිධ සමාජ විරෝධ හිංසන ක්‍රියාවන්ට පෙළඹීම සාමාන්‍ය මනුෂ්‍ය ස්වභාවය යි. තෙළිඟු ජාතිකයින් සමබන්ධයෙන් ද එය එසේමය.

භාෂාව ගත් වට තෙළිඟු ජාතීන්ගේ මුල් දේශය මෙන්ම ඔවුන් පිළිබඳ ආ ගිය විත්ති ද දැන ගැනීමට ඇති හොදම ජීවමාන සාධකය වන්නේ ඔවුන්ගේ භාෂාවයි. වත්මන් තෙළිඟු භාෂාව ඈදාගත් වචන වලින් සැදුන ලද්දක් වුව ද එය එහි ප්‍රකෘති ස්වරූපය සොයා ගැනීමට අපහසු වන තරමට වෙනස් ව නොතිබීම අපට ඇති එකම පිටුවහලය. තෙළිඟු ජාතිකයින්ගේ මුල් සිරිත් විරිත් හා ජීවන රටාව මෙන්ම ඔවුන්ගේ මුල් භාෂාව ද වෙනස් ව ඇත්තේ ඉතා සෙමිනි. මේ පිළිබඳ විවිධ වාග් විද්‍යාඥයින් විවිධ මත පල කර ඇත.

අධිකරණය ගත් විට තෙළිඟු ජාතිකයන් අතර පැන නගින ආරවුල් නඩුහබ ඔවුන් විසින්ම විසදාගනු ලබයි. විනිශ්චයකරු හැටියට ක්‍රියා කරන්නේ ආරච්චි හෙවත් ප්‍රධානියා ය. පැමිණිල්ල ලද විට ආරච්චිගේ ප්‍රධානත්වයෙන් කුප්පායමේ රැස්වීමක් කැදවා පැමිණිල්ල විභාගයට ගනු ලබන්නේ පැමිණිලිකාර පක්ෂය විසින් සපයන ලද රා පානයෙන් හෝ අරක්කු පානයෙන් විත්ති පක්ෂය ඇතුළු සියලු දෙනාම සප්පායම් වීමෙන් අනතුරුවය.

ජනගහනය වැඩිවීම නවීකරණය නාගරීකරණය ඉඩම් නොමැතිවීම ආදිය නිසා ඔවුන්ට සාම්ප්‍රාධායික හැසිරීම් පද්ධතිය ආරක්ෂා කිරීමට බාධක ගොඩනැගිලි අතීතයේ පටන්ම තෙළිඟු ජනයා සංක්‍රමණ ජීවිතයෙන් මුදවා ස්ථිර නිවාස වල රැදවීමට අතීතයේ පටන් විවිධ රජවරුන් යටතේ ඔවුන් වේගයෙන් මහා සමාජය හා අනුගත වෙමින් පවතී. රජය විසින් ද මොවුන් මහා සමාජයට අනුගත කිරීමට නොයෙක් උත්සහ දරා ඇත. 1980න් පසු තෙළිඟු ප්‍රජාවට මහවැලි ව්‍යාපාරය යටතේ ස්ථිර ඉඩම් ලබා දී ගොවිතැනට හුරුකිරීමට කටයුතු කළහ. අපනයන සැකසුම් කලාප ඉදිවීමත් සමඟ තෙළිඟු කාන්තාවන්ට රැකියා ලැබීම ඇතැමුන් විදේශ සේවයට යොමුවීම හා තෙළිඟු කාන්තාවන්ට රැකියා ලැබීම ඇතැමුන් විදේශ සේවයට යොමුවීම හා තෙළිඟු තරුණයින් යුධහමුදා සේවයට බැදීම සිදු විය. මොවුන් තවදුරටත් තම සාම්ප්‍රාධායිකත්වයෙන් මිදී මහසමාජයට අනුගතවීම වේගයෙන් සිදුවෙමින් පවතී.

කුඩාගම තෙළිඟු ජාතිකයන්ගේ අනාගතය ගත් විට ලෝකයේ විවිධ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ තෙළිඟු ජාතිකයන්ට ද මුහුණ පෑමට ලැබී ඇති අත්දැකීම අනුව විමසා බලන කල්හී අනාගත ලෝකයේ ඔහුට හිමිවන තැන කුමක් දැයි අනුමාන කිරීම අසීරු නැත. තෙළිඟු ජනයාට තම තමන්ගේ පාරම්පරික ජීවන වෘත්තීන් අතහැර දමා කම්කරුවන් කාර්මික ශිල්පීන් ආදී වශයෙන් සේවය කිරීමට සිදු ව ඇත. එසේම වර්තමානය වන විට ඔවුන් ස්ථාවර ජීවිතයකට හැඩගැසෙමින් පවතී. තතු එසේ වුව ද තෙළිඟු ජාතිකයන් ස්වකීය ගෝත්‍රයේ අනන්‍යතාව පිළිබඳ සෑම කල්හිම සිතමින් පසුවන අතර ඒ ගැන සාඩම්බර වන බව ද අමතක කළ නොහැකක්කි.

## නිගමනය

කුඩාගමවාසී තෙළිඟු ජාතිකයින් තුළ සමාජ, සංස්කෘතික, ආර්ථික, දේශපාලන, අධ්‍යාපන හා ආගමික කටයුතුවල දී තෙළිඟු භාෂාව සමඟ මිශ්‍රව සිංහල දෙමළ භාෂා ද යොදා ගන්නා අතර රැකියාවේ දී නම් අවශ්‍ය ලෙස භාෂාව මාරු කර ගැනීමට ඔවුන් සමත්කමක් දක්වයි. එමෙන්ම මේ වන විට තෙළිඟු භාෂකයින්ගේ සංස්කෘතිය තුළ ඉස්මතු වී පෙනෙන විශේෂත්වයන් දක්නට ඇති බවත් මේ වන විට තෙළිඟු වහර මෙන්ම සංස්කෘතිය ක්‍රියෝලහරණ අවධානමකට ලක්ව ඇති බවත් මෙම පර්යේෂණය මඟින් අනාවරණය විය.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. ගයිගර්, විල්හෙල්ම්, මාධ්‍ය කාලීන ලංකා සංස්කෘතිය. පරිවර්තක ඇම්. බී. ආරියපාල. කොළඹ : සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
2. ජයසුන්දර, එම්. ඩබ්. සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රම, සාරංගි ප්‍රින්ටර්ස්, 2015.
3. දිසානායක, ජේ. බී. මානව භාෂා ප්‍රවේශය, ස්ටැම්ෆර්ඩ් ලේක් සමාගම, කොළඹ, 2005.
4. ධර්මදාස, කේ. එන්. ඕ. භාෂාව හා සමාජය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2006.
5. ධර්මදාස, කේ. එන්. ඕ. 'අභිගුණ්ඨික ජනයා' මහවැලිවංශය 2 කාණ්ඩය. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1985.
6. හෙට්ටිආරච්චි, ඩී. ඊ. ලංකාවේ භාෂා, කතෘ ප්‍රකාශන.
7. හේරත්, කුසුම්, උපසංස්කෘතික උප භාෂා සමීක්ෂණ, කොළඹ 10 : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2007.